---

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 ජුලි 17 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 30 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව , සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපැම හැර 2012 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබද තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වු මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) මොනරාගල දිසා අධිකරණයේ පවරා ඇති නඩු අංක එල්-2128 දරන නඩුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවිය යුතු නීතිඥ ගාස්තු වූ රු.15,000 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) රු.132,484 ක් වූ සමාලෝචිත වර්ෂය අවසානයට ගමනැගුම ව්‍යාපෘතියේ මුදල් පොතේ ශේෂය රු.311,619 ක් ලෙස ගිණුමේ දක්වා තිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.4,546,283 ක වත්කම් රු.9,838,760 ක් වූ වගකීම්ද රු.204,970 ක ගනුදෙනුද විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,166,375 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වරෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,826,466 ක් විය.

**2.2 අයවැය මූල්‍ය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත වියදම හා වර්ෂයේ තථ්‍ය වියදම අතර සියයට 15 සිට සියයට 100 දක්වා විචලනයක් පැවති හෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හාබදු | 2 | - | - |
| (ii) | බදු කුලී | 12,115 | 5,863 | 459 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 702 | 967 | - |
| (iv) | වෙනත්ආදායම් | 2,476 | 2,071 | - |

### 2.3.2 බදු කුලී

(අ) අවුරුදු 05 කට වැඩි කාලයක සිට කඩ කාමර 09 කින් අය නොවී පවතින හිඟ කඩ කාමර කුලී රු.23,750 ක්ද අවුරුදු 02 කට වඩා කාලයක සිට කඩ කාමර 42 කින් අය නොවී පවතින කඩ කමර කුලී රු.283,650 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය ප්‍රකාරව කඩ කාමර කුලී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.3 වෙනත් ආදායම්

(අ) අතුරු ව්‍යවස්ථාවන් සම්මත කර ගෙන ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති සහා බල ප්‍රදේශයේ

හෝටල්/ලැගුම්හල් වලින් අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් සියයට 1 නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | (රු.) |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,114,583 |
| (ii) | මුද්දර ගාස්තු | 499,960 |

**2.4 අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු.723,414 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**2.5 නිශ්ක්‍රීය භෞතික සම්පත්**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත් ට්‍රැක්ටර් 02 ක් වසර 2 ½ ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතින

**2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජනවාරි 25 දිනැති අංක 12/ආ/061 අතිරේක ඉන්ධන දරන ලිපිය ප්‍රකාර සභාව සතු 252-6385 දරන කැබ් රථය සඳහා අනුමත මාසික ඉන්ධන සීමාව වූ ලීටර් 312 ඉක්මවා 2012 ජනවාරි සිට 2012 නොවැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට රු.68,632 ක් වටිනා ඉන්ධන ලීටර් 619 ක් පාවිච්චි කර තිබුණද ඉහත ලිපියේ 4 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.7 කොන්ත්‍රාත් පරිපාලනය**

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) 2012 මගනැගුම ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන යටතේ මාර්ග 02 ක කුට්ටිගල් ඇතිරීමේ කර්මාන්තයට රු.1,000,000 ක් වැය කර තිබූ නමුත් අනුමත ඇස්තමේන්තුව ප්‍රකාරව මාර්ගය අලුත්වැඩියා කළ යුතු වර්ග මීටර 32.4 ක් ඉටුකර නොතිබූ බව 2012 නොවැම්බර් 08 දින කරන ලද පරික්ෂාවේදි අනාවරණය විය.

(ආ) ඉහත මාර්ග වැඩ සටහන යටතේ, 124 බී තිස්ස පුර, 217 නිවාස පාර ප්‍රතිසංස්කරණයේදී කොන්ක්‍රීට් කුට්ටි ගල් මීටර් 30 පමණ ප්‍රමාණයේ අතරට ගඟේ වැලි යොදා නොතිබූ අතර සම්පූර්ණ ප්‍රමාණයම නියමිත තෙරපුම් යන්ත්‍රයකින් තලා නොතිබූ බැව් 2012 නොවැම්බර් 08 දින කරන ලද ස්ථානීය පරිකෂාවේ දී අනාවරණය විය. ඒ අනුව ඉටුනොකල වැඩ කොටස් සඳහා රු.29,250 ක් ගෙවා තිබුණි.

(ඇ) 2012 මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ ඉදිගස් ඇල්ල ඇලේලන්ද මාර්ගයේ කොන්ක්‍රීට් ගල් ඇල්ලීමේ අදියර VI හා VII සඳහා කොන්ත්‍රාත් සමිතියට රු.996,316 ක් ගෙවා තිබුණි.

රු.500,000 ක ප්‍රතිපාදන සඳහා ආසන්න වශයෙන් අතුරා තිබිය යුතු කොන්ක්‍රීට් කුට්ටි 10,100 ක් සඳහා මාර්ගයේ අදියර VI හා VII යටතේ කොන්ක්‍රීට් කුට්ටි 9,500 බැගින් අතුරා තිබුණි. 2013 ජුලි මස 23 දින මාර්ගයේ අදියරVI හා VII පරීක්‍ෂාවේ දී මාර්ග තලය නියමිත පරිදි තැලීම් නොකර කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා තිබීම නිසා මාර්ගයේ තැනින් තැන උස් පහත් වීම් සහ මාර්ගයේ දෙපස උරහිස් නියමිත පරිදි බොරළු දමා තැලීම් කර නොතිබූ බවත් සමහර ස්ථානවල මාර්ගයේ දෙපස කුට්ටිගල් ගැලවී ගොස් තිබුණ බවත් නිරීක්‍ෂණය විය.

(ඈ) සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදිරිපස කොටස ඉදිකිරීම සඳහා සකස් කර තිබුණ දින රහිත රු.264,733 ක් වටිනා ඇස්තමේන්තුවක් හා ද්‍රව්‍ය ඇස්තමේන්තුව සභාපති විසින් අනුමත කර නොතිබුණි. 2012 අප්‍රේල් මාසයේ ඍජු ශ්‍රමය මත ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට රු. 57,335 ක වටිනාකමට ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණ අතර 2013 ජුලි 23 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

## 2.8 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) 2012 ඔක්තෝබර් 09 දින රු.174,375 ක් ගෙවා වීථි පහන් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 පරිදි මිල ගණන් කැඳවා නොතිබුණ අතර එම වීථි පහන් තොග ලේඛනවලට ඇතුලත් කර නොතිබුණි. සවි කිරීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 387 විධිවිධාන වලට පටහැනිව 2012 දෙසැම්බර් 31 දිනට රජයේ බැංකුවක ජංගම ගිණුමෙහි රු.742,112 ක අයිරාවක් පැවතුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය,සේවය අතහැර හා මිය ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට හිඟව පවතින රු.34,469 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අවස්ථා 21 දී රු.707,628 ක මිලදී ගැනීම් රජයේ මුදල් රෙගුලාසි 751(1) පටහැනිව තොග ලේඛනවලට ඇතුලත් කර නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 237 (අ) ප්‍රකාරව රු.1,203,875 ක් වටිනා ගණුදෙණු 49 ක් සඳහා තොග සහතික නොවීය.

## 2.9 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

2009 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,467,000 ක ප්‍රතිපාදන මුදලින්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,119,109 ක වියදමක් දරා තිබුණි.
පහත කරුණු කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබූ අතර ඉදිකර තිබූ ආවරණ ගොඩනැගිල්ල,ගබඩා කාමරය හා ළිඳ සම්පූර්ණයෙන්ම ජරාවාස වී ගොඩනැගිල්ලේ ජනෙල්වල වීදුරු කැඩී ගොස් තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා 12 " පොලිතීන් සීලර් එකක් සඳහා රු.3,510 ක් 2009 වර්ෂයේදීද,පොලිතීන් බෑග් 500 ක් සඳහා රු.10,000ක්,2010 වර්ෂයේදී,ගෙවීම් කර තිබුණ නමුත් 2013 ජුලි මස 23 වන දින වන විටද මෙම ද්‍රව්‍ය සභාවට ලැබී නොතිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබූ වෙනත් කාර්යයන් සඳහා යොදවා ගෙන ඇති වටිනාකම රු.78,126 ක් වූ උපකරණ වර්ග 15 ක් පිළිබඳව විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.එමෙන්ම 3×2 ½' වානේ ලියන මේසයක් ,ප්ලාස්ටික් පුටුවක්,වයිට් බෝඩ් එකක් සහ කසල බඳුන් 07 ක් ව්‍යාපෘතිය සඳහා යොදා නොගෙන කාර්යාලයේ ගබඩා කර තිබුණි.

(ඈ) රු.1,119,109 ක් වැය කර ආරම්භ කරන ලද කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර සියඹලාණ්ඩුව හා දොඹගහවෙල නගරවලින් බැහැර කරන අපද්‍රව්‍ය කොම්පෝස්ට් අංගනය අසල පිහිටි වලකට අවිධිමත් ආකාරයට සහ පරිසරයට අහිතකර ආකාරයට බැහැර කිරීම් සිදු කරමින් පවතී.

**03.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය